**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**නිවාඩු කාලීන පැවරුම්**

**සිංහල - 9 ශ්‍රේණිය**

**නිවිතිගල අධ්‍යාපන කලාපය**

## ජනවාරි 3 සතිය

## 1 පාඩම - ශ්‍රී පාදය වැන්දවූ හැටි

❖ පාඩම හොඳින් කියවන්න.

1. මෙම වාක්‍යවල හිස්තැන් පුරවන්න.

- වඩාත් ............. අදහස් ප්‍රකාශ කිරීමට යෙදුම් උපකාරී වේ.
- වාක්‍යවල අර්ථය .............. කිරීම යෙදුම් මඟින් සිදු වේ.
- කිසියම් කතාවක්,සිදුවීමක් ආශ්‍රයෙන් ................ ගොඩනැගී ඇත.
- සෘජුව ම අරුතක් ප්‍රකාශ කරන්නේ ................. මඟිනි.
- වාච්‍යාර්ථයට වඩා ඉඳුරා ම වෙනත් අරුතක් ප්‍රකට කරන්නේ ................. ය.

(ප්‍රස්තාව පිරුළු,ආප්තෝපදේශ, තීව්‍ර,රූඪි,රසවත්)

2. මෙම වචනවල අරුත් ලියන්න.

⌘ ආප්ත ⌘ සංක්ෂිප්ත බව ⌘ රූඪි

⌘ ප්‍රස්තාව පිරුළු ⌘ ව්‍යංගාර්ථය

3.රූඩීය හා අර්ථය නිවැරදි ව ගළපන්න.

1. හුම්ටි තැබීම — ඉතා ළඟ
2. තකහනියේ — අනුබල දීම
3. හූවක දුර — අහේතුක බිය
4. හුඹස් බිය — උපකාර කිරීම
5. අත දීම — හදිසිය

7. "රන්විමනේ සිටිමුත් දුක නැති වෙද්ද" කවියේ සඳහන් ආප්තෝපදේශ තුනක් ලියන්න.

8. මෙම ප්‍රස්ථාව පිරුළුවල තේරුම් ලියන්න.

- පරංගියා කෝට්ටේ ගියා වගේ
- කළුවා මාරපන ගියා වගේ
- බැද්දට හඳ පෑව්වා වගේ
- ඉඟුරු දී මිරිස් ගත්තා වගේ

9. මෙම රූඩීවල අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය තනන්න.

- හිසේ මලක් පිපීම
- දිවෙක් දිව ගාගෙන
- දෙහි කැපීම
- වැල් වටාරම්
- කටු අත්ත

10. "අටුව කඩා පුටුව හැදුවා වගේ" ප්‍රස්ථා පිරුළ ට මුල් වූ කතා පුවත සැකෙවින් ලියන්න.

11. "හෙළ බස සරසන යෙදුම්" මාතෘකාවට රචනයක් ලියන්න.